සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
**First Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I&II | පැය / மணித்தியாலம் / Hours: 02 |

නම-----------------------------------------------------------------

**උපදෙස් : සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න අංක 1 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හා ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) සභා සම්ප්‍රදාය අනුව ශු.ලූක් තුමා ශුභාරංචිය රචනා කිරීමේ දී කරුණු අසා දැන ගත්තේ
1. ශු. ජුවාම් තුමාගෙනි 2. ශු. ජුසේ තුමාගෙනි 3. මරිය තුමියගෙනි 4. ශු. පාවුලු තුමාගෙනි

(2) ශු. ලූක්තුමා ශු. පාවුලු තුමා සමඟ සිටි බවට සාක්ෂියක් වන්නේ,
1. සකරියස් තුමාගේ යාගය නිසා
2. පාවුලු තුමා සමඟ ධර්මදූත චාරිකා වලට ගිය නිසා
3. දෙදෙනාම ලේඛකයන් නිසා
4. ග්‍රීක භාෂාව දන්නා නිසා

(3) අපගේ ජීවිතවල අවසාන අරමුණ විය යුත්තේ
1. දෙවිඳුන් කරා ළඟා වීමයි
2. දිව්‍ය පූජාවට සහභාගී වීමයි
3. යාච්ඤා කිරීමයි
4. මරණයයි

(4) යහපත් සමරිතානුවරයාගේ උපමාවෙන් ශු.ලූක් තුමා ඇගයීමට ලක් කරන්නේ,
1. ඊශ්‍රායෙල් ජාතිකයන්ය 2. ජුදා ජාතිකයන්ය 3. අන්‍ය ජාතිකයන්ය 4. ග්‍රීක ජාතිකයන්ය

(5) <u>''මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය වේවා''</u> යන ප්‍රකාශයේ ඉරි ඇඳි කොටසින් අදහස් වෙන්නේ
1. ජේසුස් වහන්සේ ජුදා ජනතාවගේ ගැලවුම්කරු බවය
2. ජේසුස් වහන්සේ සියලු මනුෂ්‍යයන්ගේ ගැලවුම්කරු බවය
3. මිහිපිට සියලු මිනිසුන් සාමකාමී බවය
4. සියලු දෙනා ම යහපත් බවය

(6) අධෛර්ය නොවී නොකඩවා යාච්ඤා කළ යුතු බව දැක්වීමට ජේසුස් වහන්සේ වදාළ උපමාව වන්නේ
1. වපුරන්නාගේ උපමාව
2. වැන්දඹුව හා විනිශ්චයකාරයා පිළිබඳ උපමාව
3. සමරිතානුවරයා පිළිබඳ උපමාව
4. පරිසිවරයා හා අයකැමියා පිළිබඳ උපමාව

(7) නැති වූ බැටළුවා පිළිබඳ උපමාවෙන් පෙන්වා දෙන කරුණක් වන්නේ
1. ජේසුස් වහන්සේගේ ආදරයයි
2. සමාව දීමේ වැදගත්කමයි
3. ජේසුස් වහන්සේ පව්කරුවන් සොයා යන බවයි
4. එකමුතුකමයි

(8) A- මරිය තුමිය B-එලිසබෙත් තුමිය C- අන්නා දිවැසිවරිය D - කුදු ස්ත්‍රිය
ඉහත කාන්තාවන් අතරින් ශු.ලූක් ශුභාරංචියේ සඳහන් කාන්තා චරිත පමණක් අඩංගු පිළිතුර වන්නේ
1. ABC 2. ABCD 3. ACD 4.ABD

(9) '' ස්වාමිනී මා සන්තක දෙයින් දෙකෙන් කොටසක් දිළිඳුන්ට දෙමි'' මෙලෙස ප්‍රකාශ කරන ලද්දේ

1. ශු.ලුක් තුමාය 2. ධනවතාය 3. යහපත් සමරිතානුවරයාය 4. සකේවුස්ය

(10) මරිය තුමිය හා ජුසේ තුමා ජේසුස් වහන්සේ වෙනුවෙන් ආගමික නීති රීති වලට ගරු කරමින් කළ ක්‍රියාවක් වන්නේ

1. ප්‍රාතිහාර්ය කිරීම 2. දේව මාළිගාවේ කැප කිරීම 3. අන්තිම රාත්‍රී භෝජනය 4. ඉගැන්වීම

(11) ධනයට වහල් නොවී සරල චාම් දිවි පෙවෙතකට හුරු වීම සඳහා කළ යුතු වඩාත් සුදුසු දේ වන්නේ

1. දිනපතා යාච්ඤා කිරීම 2. ධනය පරිස්සමින් පරිහරණය කිරීම

3. වැඩිපුර ඇති දේ බෙදා ගැනීම 4. සිතින් දිළිඳුව කටයුතු කිරීම

(12) '' තියෝපිලස්'' යන වචනයේ අර්ථය වන්නේ

1. උසස් නිලධාරියා 2. දේව සේවකයා 3. දෙවියන් වහන්සේගේ මිත්‍රයා 4. ශු.ලුක් තුමා

(13) ජේසුස් වහන්සේ කොටළුවෙකු පිට නැගී ජෙරුසලමට ගියේ

1. පාස්කු ඉරුදිනය 2. ගොබ් ඉරුදිනය 3. මහ සිකුරාදාය 4. මහ බ්‍රහස්පතින්දාය

(14) ලෝක ගැලවුම්කාරයාණන් වූ ජේසුස් වහන්සේව මෙලොවට එවීම සඳහා ජාතියක් බිහි කිරීමට දෙවියන් වහන්සේ විසින් තෝරා ගනු ලැබුවේ

1. ආදම් සහ ඒවය 2. ආබ්‍රහම් තුමාවය 3. මෝසෙස් තුමාවය 4. ස්නාවක ජුවාම් තුමාය

(15) මිකා දිවැසිවරයා ජේසුස් වහන්සේ ගැන දක්වා ඇති අනාවැකියෙන් කියවෙන්නේ

1. ජේසුස් වහන්සේ නාසරතයේ ජීවත් වන බවය
2. කන්‍යාවක් පිළිසිඳගෙන පුත්‍රයකු බිහි කරන බවය
3. ජේසු තුමා බෙත්ලෙහෙමේ උපදින බවය
4. ජේසුස් වහන්සේ අපගේ රජාණෝ බව

(16) තම වරදෙන් හා තම කැමැත්තෙන් පාපයට වැටුණු මිනිසා වෙත දෙවියන් වහන්සේගේ ප්‍රතිචාරය වූයේ

1. ඔවුන්ව දඬුවමට ලක් කිරීම 2. ඔවුන් ගැන සතුටු වීම

3. ඔවුන් ගැන දුක් වීම 4. ඔවුන්ට ප්‍රේම කිරීම

(17) සාර්ථක දිවි පැවැත්මකට වඩාත් අවශ්‍ය දෙයක් වන්නේ

1. ලෞකිකත්වයයි 2. කාර්ය බහුලත්වයයි 3. පිළිවෙල හා ක්‍රමානුකූලබවය 4. කඩිසර බවය

(18) යෙසායා දිවැසිවරයා පවසන ආකාරයට ''පාළුකරයේ මොරගසන හඬ'' ලෙස හඳුන්වා ඇත්තේ

1. ශු. පේදුරු තුමාව 2. ස්නාවක ජුවාම් තුමාව 3. ශු.පාවුලු තුමාව 4. ජේසුස් වහන්සෙව

(19) ''සමිඳාණන් වහන්සේ නුඹලාට ලකුණක් දෙන සේක. බලන්න කන්‍යාවක් පිළිසිඳ ගෙන පුත්‍රයෙකු බිහි කරන්නීය''--------------යන නම ඔහුට තබන්නීය (යෙසායා 7:14) මෙහි හිස් තැනට අදාළ වචනය වන්නේ

1. ජේසුස් වහන්සේ 2. ක්‍රිස්තුන් වහන්සේ 3. දේව පුත්‍රයා 4. එම්මානුවෙල්

(20) ශු.ලුක් ශුභාරංචියේ පණිවිඩවල දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ

1. සාමකාමීත්වයයි 2. අපෝස්තලිකත්වයයි 3. විශ්වීය බවයි 4. බලසම්පන්න බවයි

(ල. 2x20=40)

II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද තෝරාගත් අනික් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින්ද හිමි වේ**

1. ශු.ලූක් ශුභාරංචිය ඇසුරින් කරන ලද ඇගයීමට අනුව පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

   i. ශු.ලූක් තුමා පිළිබඳ ඔබ කළ ක්‍රියාකාරකම කුමක්ද? (ල.2)

   ii. ශු.ලූක් තුමා පිළිබඳව ඔබ කරුණු සොයා ගත් ආකාර 3ක් ලියන්න. (ල.3)

   iii. ශු. ලූක් ශුභාරංචියේ සඳහන් තුති පැසසුම් ගී 3ක් නම් කරන්න. (ල.3)

   iv. ශු.ලූක් ශුභාරංචිය කියවීමෙන් ඔබට ලබා ගත හැකි පණිවිඩ 4ක් ලියන්න. (ල.4)

   v. ශු.ලූක් තුමාගේ ජීවිතයෙන් ඔබට ලබා ගත හැකි ආදර්ශ 4ක් ලියන්න. (ල.4)

(ලකුණු 16)

2. i. ශු. ලූක් ශුභාරංචියේ පරමාර්ථය ලියන්න. (ල.5)

   ii. අපගේ ජීවිත දෙවිඳුන් වෙත ළගා කර ගැනීම සඳහා ඔබ ක්‍රියා කරන ආකාර 3ක් ලියන්න. (ල.6)

3. i. ශු. ලූක් ශුභාරංචිය හඳුන්වන වෙනත් නම් 5ක් ලියන්න. (ල.5)

   ii. සකේවුස් පිළිබඳ සිද්ධියෙන් අපට ගත හැකි පණිවිඩ 3ක් ලියන්න. (ල.6)

4. i. ශු. ලූක් තුමා ධනපතියා හා ලාසරස් පිළිබඳ උපමාවෙන් අපට අවධාරණය කරන පණිවිඩය කුමක්ද? (ල.5)

   ii. දේව දරුවෙකු ලෙස ඔබ ලද ජීවිතය ගැන තුති පුදමින් දෙවි පියාණන්ට යැදුමක් ලියන්න. (ල.6)

5. i. ශු. ලූක් තුමා ජේසුස් වහන්සේගේ ළමා කාලය පෙළ ගස්වා ඇති ආකාරය පිළිවෙලින් ලියා දක්වන්න. (ල.5)

   ii. පන්තියේ නායකයෙකු හෝ නායිකාවක ලෙස ඔබට කැඳවීමක් ලැබුනොත් ඔබ ක්‍රියා කරන ආකාරය කරුණු 6 කින් ලියා දක්වන්න. (ල.6)

6. i. සකරියස් තුමාට දේව දූතයා දුන් පණිවිඩය කුමක්ද? (ල.5)

   ii. මරිය තුමිය හා ජුසේ තුමාගේ ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ 3ක් ලියන්න. (ල.6)

7. i. චාතාරික කාලය තුළ දී ඔබ කළ යහපත් ක්‍රියාවන් 5ක් ලියන්න. (ල.5)

   ii. ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය සමරණ අපි, අපගේ පාපි බව පිළිගෙන ක්‍රියාකරන ආකාරය ජේළි 5කින් ලියා දක්වන්න. (ල.6)